13

# ඉරිඟු දෙව්දුව

බොහෝ කලකට පෙර කාන්ති නමැති කුඩා රතු ඉන්දියානු ගැහැනු ළමයෙක් සිටියා ය. ඇගේ ඇස් තරු මෙන් දිලෙන නිසා ඇයට මේ නම හිමි විය. සුරතල් බෝනික්කෙකු ඇය සතු විය. ඒ බෝනික්කා සාදා තිබුණේ ලීවලිනි. ඇගේ හිසකෙස් ඉරිඟු රේණුවලින් නිමවා තිබුණි. මොළොක් මුව හමින් සාදන ලද ලස්සන ඇඳුම්වලින් ඇය සරසා තිබුණි. කාන්තිට පෙනුණේ ඇය ලෝකයේ සිටින ඉතා ම ලස්සන බෝනික්කා මෙනි. ඒ නිසා කාන්ති ඇය ආදරයෙන් රැක බලා ගත්තා ය. කාන්ති යන යන තැන ඇය ද රැගෙන ගියා ය.

ඒ අවුරුද්දේ ඒ රටේ මහත් නියඟයක් ඇති විය. මාස ගණනක් තිස්සේ වැහි පොදක්වත් බිමට නො වැටුණේ ය. සෑමදා ම උදේ සිට සවස් වන තෙක් පොළොවට තද හිරු රැස් වැටිණි. ඒ නිසා තණකොළ වියළී ගියේ ය. සිවුපා සතුන්ට කෑම හිඟ විය. මිනිසුන්ගේ ආහාරබෝග ද විනාශ විය. දවසින් දවස කුසගින්නේ පෙළෙන්නට ඔවුන්ට සිදු විය.

එක් රැයක කාන්ති තම ඇතිරිල්ල මත වැතිර සිටියා ය. තද බඩගින්න නිසා ඇයට නින්ද නො ආවේ ය. ඈ බෝනික්කා තුරුලු කරගෙන කල්පනාවේ යෙදුණා ය. ඒ වේලාවේ මුළු කුඩාරම ම එළිය කරමින් ආලෝකයක් පැතිර ගියේ ය. ඒ ආලෝකය මැද ඉරිඟු කොළවලින් නළල් පටයක් පැළඳ ගත් දෙව්දුවක් මතු වී පෙනුණි.

තම මිනිසුන්ගෙන් වැඳුම් පිදුම් ලබන ඉරිඟු දෙව්දුව ඇය බව දැන ගත් කාන්ති බියට පත් වූවා ය. ඒ දෙව්දුව කාන්ති අමතා මෙසේ කීවා ය. "කාන්ති නුඹලාගේ මිනිස්සු කුසගින්නේ පෙළෙනවා.
" වැසි දෙවියන් ඔවුන් සමඟ කෝප වී ඉන්නවා. ඒ නිසා වැස්ස ලැබෙන්නේ නෑ. ඔවුන්ට පිහිට විය හැක්කේ ඔබට පමණයි."



බියට පත් කාන්ති ගල්ගැසුනාක් මෙන් බලා සිටියා ය. එහෙත් ටික වේලාවකට පසු ඈ කතා කළා ය.

"ඔවුන්ට පිහිටවීමට මට හැකි දෙයක් කරන්නට පොරොන්දු වෙන්නම්. මම කුමක් ද කරන්නේ" ඈ ඇසුවා ය. "වැසි දෙවියන්ට පූජා පිණිස නුඹේ බෝනික්කා පුලුස්සා දැමිය යුතුයි. එවිට වැස්ස ලැබේවි."

"එය නම් මට කරන්න බැහැ. මගේ බෝනික්කා මම කවදාවත් පුලුස්සන්නේ නැහැ" ඈ කෑ ගැසුවා ය.

එවිට දෙව්දුව ආලෝකයත් සමග අතුරුදහන් වූවා ය.
කාන්ති ඇතිරිල්ල මත වාඩි වී වටපිට බැලුවා ය. කොපමණ භයානක සිහිනයක් ද යි සිතමින් ඈ තම බෝනික්කා තුරුලු කර ගත්තා ය. එහෙත්

මේ සිහිනයක් නොවන බව ඇයට දැනුණි. අසරණ වූ මිනිසුන්ට පිහිටවීමට දෙව්දුව පැමිණි වාර බොහෝ විය.

කාන්ති බෝනික්කා ද රැගෙන කුඩාරමෙන් පිටතට ගියා ය. මිදුලේ ගිනිමැළය තවමත් දැල්වෙමින් පැවතිණ. අවට දැඩි අඳුරින් පිරී තිබුණි. කාන්ති ඒ ගිනිමැළය වෙත සෙමෙන් ගමන් කළා ය. දිලිසෙන ගිනි අඟුරු රතු ඇස් මෙන් ඈ දෙස බලා සිටියේ ය. බෝනික්කාත් සමග ආපසු යාමට ඈ හැරුණා ය.

එහෙත් සාගින්නෙන් පෙළෙන තම රටේ මිනිසුන් ද, ආහාර ඉල්ලා හඬන කුඩා දරුවන් ද ඇයට සිහිපත් විය. ඇසට ගලා එන කඳුළු පිස දමමින් කාන්ති බෝනික්කා ගිනිමැළයට විසි කර කුඩාරමට දිව්වා ය. හඬමින් සිටිය දී ම ඇයට නින්ද ආවේ ය.

ඊට බොහෝ වේලාවකට පසු ඇගේ අම්මා ඇය අවදි කළා ය.

"නැගිටින්න කාන්ති, නැගිටින්න.

බලන්න, වහින තද වැස්ස.

දැන් නැවතත් තණකොළ වැඩේවි. සිවුපා සතුන්ටත්, අපටත් ආහාර ලැබේවි"

කාන්ති පිටත බැලුවා ය. පොළොව වැස්සෙන් තෙමී තිබුණේ ය. එහෙත් ඇගේ හදවත දුකින් බර විය.

වැස්ස නැවතුණ විට පුදුම දෙයක් පෙනෙන්ට තිබුණි. බෝනික්කාගේ පබළු ඇට වැළ වැනි නිල්පාට මලින් මුළු පොළොව ම වැසී තිබුණේ ය.

**(රතු ඉන්දියානු ජනකථාවකි)**

## ක්‍රියාකාරකම්

01). මෙම පාඩම ශබ්ද නගා කියවන්න.

02). පාඩමේ සඳහන් සිදුවීම් ගැන සාකච්ඡා කරන්න.

03). පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

i කාන්ති කුමන ජාතියට අයත් ළමයෙක් ද?

ii කාන්තිට ඒ නම හිමිවූයේ ඇයි ?

iii කාන්ති බෝනික්කාට බොහෝ ආදරය ඇති බවට පාඩමෙහි සඳහන් සාක්ෂ්‍ය මොනවා ද?

iv නියගය නිසා ඒ රටට කුමක් සිදුවී ද?

v දෙවිදුව කාන්තිට පැවසුවේ කුමක් ද?

vi කාන්ති බෝනික්කා ගිනිගොඩට වීසි කළේ ඇයි?

04). මෙම කතන්දරය කෙටියෙන් පන්තියට ඉදිරිපත් කරන්න.

05). මෙම කතන්දරයේ ප්‍රධාන සිදුවීම් ගොනුකොට කියන්න.

06). පාඩමේ සංවාද තෝරා දෙබසක ආකාරයට කියන්න.

07). මෙම ඡේදයෙන් කියවෙන අදහස කෙටියෙන් ලියන්න.

"ඒ අවුරුද්දේ ඒ රටේ මහත් නියගයක් ඇති විය. මාස ගණනක් තිස්සේ වැහි පොදක්වත් බිමට නො වැටුණේ ය. සෑමදා ම උදේ සිට සවස් වන තෙක් පොළොවට තද හිරු රැස් වැටිණි. ඒ නිසා තණකොළ වියළී ගියේ ය. සිවුපා සතුන්ට කෑම හිඟ විය. මිනිසුන්ගේ ආහාරබෝග ද විනාශ විය. දවසින් දවස කුසගින්නේ පෙළෙන්නට ඔවුන්ට සිදු විය."

08). i පන්තියේ සිසුන් කණ්ඩායම්වලට බෙදී විවිධ රටවල ජනකතා එක්රැස් කරන්න.

ii එක්රැස් කළ ජනකතා කණ්ඩායම් අතර හුවමාරු කර ගනිමින් කියවන්න.

## භාෂා භාවිතය

01). පහත සඳහන් වාක්‍ය කියවන්න.

සුරතල් බෝනික්කෙකු ඇය සතු විය.

තද බඩගින්න නිසා ඇයට නින්ද නො ආවේ ය.

සිවුපා සතුන්ට කෑම හිඟ විය.

මේ වාක්‍යවල යටින් ඉරි ඇඳි පදවලින් ඊළඟට යෙදී ඇති පදය විශේෂ කර දක්වයි. කිසියම් පදයක් විශේෂ කර දක්වන එවැනි පද "විශේෂණ පද" සේ සැලකේ.

මෙම පාඩමේ ඇතුළත් විශේෂණ පද සහිත වාක්‍ය ඔබගේ අභ්‍යාස පොතේ ලියන්න.

විශේෂණ පද යටින් ඉරක් අඳින්න.

02). පහත සඳහන් වාක්‍ය කියවන්න.
ඒ නිසා කාන්ති ඇය ආදරයෙන් රැක බලා ගත්තා ය.
මිනිස්සු සතුටින් කතාබස් කළහ.

මේ වාක්‍යවල යටින් ඉරි ඇඳ ඇති පදවලින් ක්‍රියාපදය විශේෂ කොට දක්වයි. එවැනි පද ක්‍රියා විශේෂණ නමින් හැඳින්වේ.

මෙම පාඩමේ ඇතුළත් එවැනි ක්‍රියා විශේෂණ පද සහිත වාක්‍ය "අ" වගුවේ ලියන්න.

ක්‍රියා විශේෂණ පද යොදා ඔබ විසින් නිර්මාණය කරන ලද වාක්‍ය 05ක් "ආ" වගුවේ ලියන්න.

| අ | ආ |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |
| 4. | 4. |
| 5. | 5. |

03. අතිරේක කියවීම.

# ප්‍රීතිමත් කුමාරයා

නගරයේ මැද උසට තැනූ ප්‍රතිමාවක් වෙයි. දීප්තිමත් නිල් මැණික් කැට දෙකකින් එහි ඇස් සරසා ඇත. ප්‍රතිමාවෙහි පසෙකින් එල්ලා ඇති කඩු මිටෙහි විශාල රතුපාට මැණික් ගලක් වෙයි.

මෙය කෙතරම් අලංකාර ප්‍රතිමාවක් ද යනු සියලු දෙනාගේ කතිකාව විය.

"මොකද ඔයාට අර ප්‍රීතිමත් කුමාරයා වගේ වෙන්න බැරි" යැයි කියමින් මවක් හඬමින් සිටි තමාගේ පුතා සැනසුවා ය.

"මේ ලෝකේ කවුරු හරි සතුටින් ඉන්නවා නම් මට හරි සතුටුයි" සිනා පිරි ප්‍රතිමාව දෙස බලා සිටි අසරණ මිනිසෙක් කී ය.

එක් රාත්‍රියක මේ නගරයට වැහිළිහිණියෙක් පියාඹා ආවේ ය. උගේ යහළුවන් ඊට සති හයකට පෙර ඊජිප්තුවට පිටත් ව ගොස් තිබුණි. නගරයට පැමිණි වැහිළිහිණියා රාත්‍රිය ගත කිරීමට තැනක් සෙවී ය. එවිට ඌ රනින් කළ ප්‍රතිමාව දුටුවේ ය.

"මෙතැන හුඟක් උසයි. ඒ නිසා පිරිසිදු වාතය ලැබේවි. මම අද මෙහි ගත කරනවා." මෙසේ සිතමින් වැහිළිහිණියා ප්‍රතිමාවේ දෙපා අතරට වී වටපිට බලා නිදන්නට සූදානම් වන විට ම සීතල වතුර බිංදුවක් උගේ අත්තටු මත වැටිණ. වැහිළිහිණියා ඉහළ බැලී ය.

"මේක හරි පුදුම දෙයක්. අහසේ වලාකුළක්වත් පේන්න නැහැ තාරකා දීප්තිමත් ව බබළනවා. නමුත් වහිනවා. මේ රටේ කාලගුණය නම් හරි ම නරකයි." ඌ තමාට ම කියා ගත්තේ ය. එවිට ම තවත් වතුර බිංදුවක් වැටුණේ ය.

"මේ ප්‍රතිමාවෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? සෙවණක්වත්

නොලැබෙනවා නම්! මම යනවා වෙනත් තැනකට" මෙසේ කියමින් ඌ අත්තටු විහිදනවාත් සමඟ ම තවත් වතුර බිංදුවක් වැටුණේ ය. වැහිළිහිණියා නැවතත් ඉහළ බැලී ය. ඌ දුටුවේ කුමක් ද? ප්‍රතිමාවේ ඇස්වල කඳුළු පිරී තිබුණි. ඒවා රන්වන් මුහුණ දිගේ ගලා එමින් තිබුණේ ය.

"ඔබ කවුද?" යි වැහිළිහිණියා ඇසී ය.

"මම තමයි ප්‍රීතිමත් කුමාරයා"

"ඔබ ප්‍රීතිමත් කුමාරයා නම් ඇයි අඬන්නේ?" වැහිළිහිණියා ඇසී ය.

"මම ජීවත් වූ කාලයේ මටත් අනෙක් මිනිසුන්ට වගේ හදවතක් තිබුණා. ඒත් මම දැනගෙන හිටියේ නැහැ කඳුළු කියන්නේ මොනවා ද කියා. මම දවස පුරා ම යහළුවන් සමඟ උයනේ සෙල්ලම් කළා. සවස විශාල ශාලාවේ නැටුම් ගැයුම්වල යෙදුණා. උයන වටා විශාල තාප්පයක් තිබුණා. ඒත් කවදාවත් ම මම ඇහුවේ නැහැ අනෙක් පැත්තේ තිබෙන්නේ මොනවා ද කියා. මම ජීවත් වුණේ සැපෙන් සතුටෙන් පිරුණු ලස්සන ලෝකයක. ඒත් දැන් මම මැරිලා. මැරුණට පසු මිනිස්සු මා මේ විධියට උසින් තැබුවා. දැන් මට පේනවා මගේ නගරයේ තිබෙන හැම දුකක් ම, අවලස්සනක් ම. මගේ හදවත හදලා තියෙන්නේ අළු පාට බර ලෝහයකින් ඊයම්වලින්. ඒක පණ ඇති මිනිසකුගේ හදවත වගේ නොවෙයි. නමුත් මට හැඟීම් තියෙනවා. මම අඬනවා".

"අනේ! එහෙනම් මොහු සාද තිබෙන්නේ රන්වලින් නෙවෙයි. පිට පැත්ත පමණයි රත්රන්" වැහිළිහිණියා තමාට ම කියා ගත්තේ ය.

"වැහිලිහිණියෝ, මෙතැනට හුඟාක් දුරින් කුඩා වීදියක දුප්පත් ගෙදරක් තිබෙනවා. එහි ජනේලය ඇරිලා. මට එයින් පේනවා වැහැරීගිය මුහුණක් ඇති මවක්. ඇගේ අත් රළුයි. ඈ රාජ කුමාරියකට ඇඳුම් මහමින් සිටිනවා. ඇගේ පුතා අසනීප වී ඇඳේ වැතිරී කෑම ඉල්ලමින් අඬනවා. ඒත් ඇයට දෙන්න දෙයක් නැහැ. ඔබට පුළුවන් ද? මේ කඩු මිටෙහි තිබෙන රතු මැණික රැගෙන ගොස් ඇයට දෙන්න".

"මගේ යහළුවෝ මං එනතුරු ඊජිප්තුවේ බලා ඉන්නවා ඇති"

වැහිළිහිණියා කී ය.

"පුංචි වැහිලිහිණියෝ, එක රැයක් මා වෙනුවෙන් නතර වෙන්න පුළුවන් ද? අර පිරිමි ළමයා අඬනවා. අම්මා හරිම දුකෙන් ඉන්නේ."

"මම පිරිමි ළමයින්ට කැමති නෑ" වැහිළිහිණියා කී ය.

"පසුගිය ග්‍රීෂ්ම ඍතුවේ දී මම ගඟට උඩින් පියාඹද්දී පිරිමි ළමයි දෙන්නෙක් මට ගල් වීසි කළා" කියමින් ඌ කුමාරයා දෙස බැලී ය.

කුමාරයාගේ මුහුණ දුකින් පිරී තිබෙනු දැක ඌ කනගාටුවට පත් විය.

"මෙතැන හරි ම සීතලයි. ඒත් මම ඔබ වෙනුවෙන් මෙහි රැයක් නතර වෙන්නම්".

"ඔබට බොහොම ස්තුතියි" කුමාරයා කී ය.

වැහිළිහිණියා කඩු මිටෙහි වූ රතු මැණික ගෙන පියෑඹී ය. පල්ලියක් අසල දී ඌට මිහිරි ගීතිකා ඇසිණ. මාලිගාව අසලින් පියාසර කරද්දී ප්‍රීති උත්සවයක් දක්නට ලැබිණ. නගරයේ වෙළඳ සැල් ජනයාගෙන් ගැවසී තිබුණේ ය. අන්තිමේ දී ඌ දුප්පත් නිවසට ළඟා විය. ජනේලයෙන් එබී බැලූ විට දුටුවේ ළමයා ඇඳේ වැතිරී කෙඳිරිගාමින් සිටින අන්දමයි. මව විඩාබර ව නිදා වැටෙමින් සිටියා ය. වැහිළිහිණියා රතු මැණික මේසය මත තබා කුමාරයා වෙත පැමිණියේ ය.

"ඒක හරි පුදුමයි. ඔබ කළේ හොඳ දෙයක්" කියමින් වැහිළිහිණියා කුමාරයාගේ දෙපා අතරට වී නින්දට වැටුණේ ය. පසුවදා උදා විය. වැහිළිහිණියා කුමාරයා වෙත පැමිණ,

"මම දැන් ඊජිප්තුවට යන්නයි මේ සූදානම් වන්නේ. ඔබට මගෙන් උවමනා මොනවා ද" යි ඇසී ය.

"පුංචි වැහිළිහිණියෝ, තව එක දවසක් මා සමඟ නතර වන්න ඔබට පුළුවන් ද? නගරයෙන් බොහෝ ඈත ගෙදරක පුංචි කාමරයකට වී කතන්දර

පොතක් ලියමින් තරුණයෙක් සිටිනවා. ඔහුගේ දෑස් නිදිබර නිසා අඳුරු වෙලා. කඩදාසිවලින් පිරුණු ඔහුගේ මේසය පසෙක වියළී ගිය මල් රැසක් විසිරී තිබෙනවා. ගිනි උඳුන නිවී ඇති නිසා ඔහු සීතලේ ගැහෙනවා. ඔහුට තවත් කෙසේවත් ලිවීමට බැහැ. ඔහු බඩගින්නේ දුර්වල වෙලා.

මගේ මේ ඇස්වල තිබෙන්නේ අවුරුදු දහසකට කලින් ඉන්දියාවෙන් ගෙන්වූ නිල් මැණික් කැට. ඔබට පුළුවන් ද එයින් එකක් ඔහුට රැගෙන ගොස් දෙන්න. ඔහු ඒක විකුණා ආහාරත් උඳුනට දරත් ගනීවි".

"මට බෑ ඒක කරන්න. ඔබේ ඇස් ඉවතට ගන්ට මට බැහැ". කියමින් වැහිළිහිණියා හඬන්ට පටන් ගත්තේ ය.

"පුංචි වැහිළිහිණියෝ, මගේ ඉල්ලීම ඉටු කරන්න".

දුකෙන් තැවෙමින් වැහිළිහිණියා ඇසක වූ නිල් මැණික ගලවා ගෙන ගොස් මේසය මත වූ මල් මත තබා පැමිණියේ ය.

"මම ආවේ ඔබට සුබ පතන්න" යි වැහිළිහිණියා කී ය. "වැහිළිහිණියො" පුංචි වැහිළිහිණියෝ, ඔබ තව රැයක් මා සමඟ නතර වන්නේ නැද්ද?" ඔහු ඇසී ය.

"මේ සීත ඍතුවයි. හුඟාක් සීතල හිම වැටේවි. ඊජිප්තුවේ හිරු උණුසුම්. ගස් කොළ පාට වෙලා ඇති. මම ඔබ හැර යා යුතුයි. නමුත් මට ඔබ අමතක නො වේවි. ඊළඟ වසන්තයේ දී මම ඔබට මැණික් කැට දෙකක් ගෙනැවිත් දෙන්නම්. මුහුදේ නිල්පාටත් රතු රෝසමලේ රතුපාටත් වගේ" වැහිළිහිණියා කී ය.

"පුංචි ගැහැනු ළමයෙක් ගිනිපෙට්ටි විකුණමින් සිටිනවා. ඈ අතින් ඒවා වතුරට වැටී පෙඟුණා. මුදල් ටිකක් රැගෙන නො ගියොත් පියා ඇයට තළාවි. ඒ නිසා ඇය අඬමින් සිටිනවා. මගේ අනෙක් ඇසේ ඇති මැණික් කැටය ගෙන ගොස් දෙන්න පුළුවන් ද?"

"මම තව එක රැයක් ඔබ සමඟ ඉන්නම්. නමුත් මට ඔබේ අනෙක් ඇසත් ගන්න නම් බැහැ. එවිට ඔබ අන්ධ වේවි." වැහිළිහිණියා දුකින්

තැවෙමින් කී ය.

"වැහිළිහිණියෝ, මම කියන දේ ඉටු කර දෙන්න." කුමාරයා කී ය. එවිට වැහිළිහිණියා කුමාරයාගේ අනෙක් ඇස ද ගෙන ගොස් ගැහැනු ළමයා අත තැබී ය.

"කොපමණ ලස්සන වීදුරු කැටයක් ද මේ" කියමින් ඇය සිනා සෙමින් ගෙදර දිව්වා ය.

ඉන්පසු වැහිළිහිණියා කුමාරයා අමතා මෙසේ කී ය.

"ඔබ දැන් අන්ධයි. ඒ නිසා හැම වේලේ ම මම ඔබ ළඟ ඉන්නවා".

"නැහැ, නැහැ, ඔබ ඊජිප්තුවට යා යුතුයි" ඔහු කීවේ ය.

"මම ඔබ ළඟ නිරතුරුව ම ඉන්නවා" යි කියමින් වැහිළිහිණියා ඔහුගේ දෙපා අතරට වී නිදා ගත්තේ ය.

පසුවදා මුළු දවසේ ම කුමාරයා ළඟ හිඳිමින් විවිධ පක්ෂීන් ගැනත් සොහොන් ගැබ්වල නිදන ඊජිප්තු රජවරුන් ගැනත් විවිධ කතා වැහිළිහිණියා ඔහුට කී ය.

"වැහිළිහිණියෝ, මගේ නගරයේ පියාඹා ගොසින් ඔබ දකින පුදුම දේවල් මටත් කියන්නැ" යි කුමාරයා කී ය.

වැහිළිහිණියා නගරයේ විශාල ගොඩනැගිලි ඉහළින් පියාසර කළේ ය. එවිට අලංකාර මන්දිරවල ප්‍රීති වන ධනවතුන් ද, ඔවුන්ගේ දොරටුවල සිඟමන් යදින අසරණයන් ද, බඩගින්නේ වැතිර හඬන ළමයින් ද දුටුවේ ය. ඒ තොරතුරු ඇසූ කුමාරයා බොහෝ දුක් විය. ඔහුගේ නියමය පරිදි ප්‍රතිමාව ආවරණය කොට තිබූ සිහින් රන්වන් කොළ ද එකිනෙක ගලවා ඔවුන්ට රැගෙන ගොස් දීමට වැහිළිහිණියාට සිදු විය.

ශීත ඍතුව නිසා හිම වැටිණි. පාරවල් රිදීයෙන් කළාක් මෙන් හිමෙන් පිරී ගියේ ය. ගෙවල්වල පියසි අග රිදීකෙඳි මෙන් හිම රැඳිණ. සෑම කෙනෙක් ම ගමන් ආරම්භ කළේ ඝන ශීත කබා පැළඳ ගනිමිණි. අසරණ

වැහිලිහිණියා සීතලෙන් ගැහුණේ ය. එහෙත් ඌ කුමාරයා අත්හැර නො ගියේ ඔහු කෙරෙහි පැවති ආදරය නිසා ය. තම මරණය ඉතා සමීප බව වැහිලිහිණියාට දැනුණේ ය. කුමරාට සුබ පතා අවසන් වනවාත් සමග ම ඌ ඔහුගේ දෙපා මුල මැරී වැටුණේ ය. ඒ සමඟ ම ප්‍රීතිමත් කුමාරයාගේ ප්‍රතිමාව ද සිහින් හඬක් නංවමින් පිපිරී ගියේ ය. පසුදින උදෑසන නගරාධිපතිතුමා මිතුරන් සමඟ නගරයේ ඇවිදිමින් සිටියේ ය. ප්‍රතිමාව දෙස බැලූ ඔහු දුටුවේ දීප්තියෙන් තොර හිඟන්නකුගේ වැනි විරූපී රුවකි. ඔහුගේ නියමය පරිදි සේවකයෝ එය නගරයෙන් ඉවත් කළෝ ය.

**(ඔස්කාර් වයිල්ඩ්ගේ** The happy prince **ඇසුරෙනි.)**